# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
# University of Kelaniya - Sri Lanka

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
## Centre for Open and Distance Learning

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2008

**Bachelor of Arts (General) Degree First Examination**
**(External) – 2008**

මානවශාස්ත්‍ර පීඨය
**Faculty of Humanities**

වාග්විද්‍යාව - LING -E1015
**Linguistics - LING -E1015**

වාග් විද්‍යා ප්‍රවේශය

කැමති ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න
Answer five (05) questions only

| | |
|---|---|
| ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි | කාලය : පැය 03 යි |
| **No. of questions : 08** | **Time : Three hours** |

01. 'මානව භාෂාව' යන සංකල්පය පැහැදිලි කරන්න.

Clarify the concept of 'Human Language'.

02. ''නූතන වාග්විද්‍යාව දහනව වන සියවසේ වාග්විද්‍යාවෙන් වෙනස් වන්නේ එය භාෂාවේ ව්‍යුහය විස්තර කිරීමට මුල් තැන දෙන නිසාය.'' විමසන්න.

"Modern linguistics differs from the nineteenth century linguistics in that it gives priority to the structural description of language." Enquire.

03. සොසීය 'ලොං' යනුවෙන් ද, චොම්ස්කි 'භාෂා ශක්‍යතාව' යනුවෙන් ද හඳුන්වන්නේ එකම භාෂා ලක්ෂණය ද? නැතහොත් එකිනෙකට වෙනස් ලක්ෂණ දෙකක් ද?

Are Saussure's 'Langue' and Chomsky's 'Language competence' the same or two different aspects of language?

04. විග්‍රහාත්මක වාග්විද්‍යාවත් සාම්ප්‍රදායික ව්‍යාකරණයත් එකිනෙකින් වෙනස් වන ආකාරය දක්වන්න.

Point out how the descriptive linguistics and traditional grammar differ from each other.

05. භාෂා විශ්ලේෂණයේ දී අපහරණය කර ගත හැකි භාෂා අනුපද්ධති <u>තුනක්</u> පිළිබඳ සටහනක් ලියන්න.

Write a note on <u>three</u> sub-systems of language which may be abstracted in the analysis of language.

06. සිංහල උපභාෂා අතර දැකිය හැකි වෙනස්කම් කීපයක් ගෙනහැර දක්වමින් 'උපභාෂාව' යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

Identify 'Dialect' by showing a few dialectal features appeared in Sinhala.

07. භාෂණය හා ලේඛනය අතර ඇති වෙනස්කම් සාහිත්‍යයික භාෂා සියල්ලට පොදුය; එහෙත් භාෂා ද්විරූපතාව භාෂා අතළොස්සකට සීමා වේ. විස්තර කරන්න.

'The difference between speech and writing is common to all literary languages; but 'Diglossia' confines itself to a handful of languages.' Elaborate.

08. භාෂා විශ්ලේෂණයේ දී විග්‍රහාත්මක (සමකාලීන) මානය ඓතිහාසික මානයට වඩා මූලිකය යන පිළිගැනීමට පදනම් වන මූලික හේතුව කුමක්දැයි දක්වන්න.

Give out the basic reason for the assumption that the descriptive (Synchronic) dimension is more basic than the historical (Diachronic) dimension of the analysis of language.

**************************